# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1721/5 - 2011 අගෝස්තු 29 වැනි සඳුදා - 2011.08.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 11/79.

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 5 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (භාරවන්නන්ගේ රැකවරණය සහ පුනරුත්ථාපනය) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල අරමුණ, මෙම නියෝග ක්‍රියාත්මක වීමෙන් පසු භාරවන යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන පනතේ) විධිවිධාන අනුව කටයුතු කරනු ලබන බවට සහ මේ නියෝග ක්‍රියාත්මක වීමට පෙරාතුව යම් වේලාවක බලාත්මකව පැවති යම් හදිසි අවස්ථා නියෝගයක් ප්‍රකාරව භාර වන ලද තැනැත්තන් විසින් මේ නියෝග ප්‍රකාරව, ඔවුන් විසින් කලින් භුක්ති විඳින ලද රැකවරණය සහ ආරක්ෂාව ම භුක්ති විඳීම සහතික වීම වන්නේ ය.

3. (1) ජනාධිපතිවරයා විසින් මේ නියෝගයේ කාර්ය සඳහා කරනු ලබන නියමයක් මගින් පුනරුත්ථාපන කොමසාරිස්-ජනරාල්වරයා වශයෙන් කටයුතු කිරීම සඳහා තැනැත්තෙකු, නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) පුපුරණ ද්‍රව්‍ය පනත, 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත, තුවක්කු ආඥාපනත, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය, VII වැනි පරිච්ඡේදය හෝ VIII වැනි පරිච්ඡේදය හෝ 2011 අගෝස්තු මස 30 වැනි දිනට පෙරාතුව බලාත්මකව පැවති යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක්

සම්බන්ධයෙන් හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට බියෙන් යම් පොලිස් නිලධරයකුට හෝ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයකුට හෝ යම් රජයේ නිලධරයකුට හෝ ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට හෝ භාරවන (මෙහි මින්මතු "භාරවන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට ඔහු ස්වේච්ඡාවෙන් භාරවන බවට වූ ලිඛිත ප්‍රකාශයක් නිලධරයාට හෝ ඒ වෙනුවෙන් බලයලත් තැනැත්තාට දෙන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

4. භාරවන්නන් භාරගැනීමේ හා තබා ගැනීමේ කාර්ය සඳහා (මෙහි මින්මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආරක්ෂක නවාතැන් දීමේ සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන" යනුවෙන් හැඳින්විය යුතු මධ්‍යස්ථාන රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, කලින් කල, අනුමත කළ යුතු ය.

5 (1) 3 වැනි නියෝගයේ (2) වන ජේදය අනුව, යම් තැනැත්තෙක් භාරවන්නේ යම් නිලධරයකු හෝ තැනැත්තකු වෙත ද, එම නිලධරයා හෝ තැනැත්තා විසින්, ඒ භාර වීම සිදු වී දින දහයක් ඇතුළත ඒ භාරවන්නා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා වෙත භාරදිය යුතු අතර, පුනරුත්ථාපන කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඒ භාරවන්නා මධ්‍යස්ථානයකට භාර දෙනු ලැබිය යුතු ය. මධ්‍යස්ථානයකට වෙන් කර යවනු ලැබීමෙන් පසු භාරවන්නා මධ්‍යස්ථානයේ රැඳී සිටින කාලය තුළ දී වෘත්තිය, කාර්මික හෝ වෙනත් පුහුණුවක් සලස්වාදීම පිණිස පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා විසින් උත්සාහ ගත යුතු ය.

(2) 3 වැනි නියෝගයේ (2) වැනි ජේදය අනුව යම් තැනැත්තෙක් භාර වන්නේ යම් නිලධරයකු හෝ තැනැත්තකු වෙත ද, එම නිලධරයා හෝ තැනැත්තා විසින්, භාරවන්නා පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා වෙත භාර කිරීමෙන් දින දහයක කාලයක් ඇතුළත දී ස්වේච්ඡාවෙන් භාරවීමක් සිදු වූ බවත් ඒ තැනැත්තා (1) වන ජේදයේ දක්වා ඇති ආකාරයට පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයාට භාරදීමට යෙදුනු බවත් රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දන්වා සිටිය යුතු ය.

6 (1) භාරවන්නා පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා වෙත භාරදුන් බව 5 වැනි නියෝගයේ (2) වන ජේදය ප්‍රකාරව තැනැත්තකු භාරවන්නේ යම් නිලධරයකු හෝ තැනැත්තකු වෙත ද, එම නිලධරයා හෝ තැනැත්තා විසින් රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දීමක් ලැබීමේ දී ඔහු විසින් ඒ භාරවන්නා පළමු අවස්ථාවේ දී මාස දොළහකට නොවැඩි කාලසීමාවක් සඳහා ඔහු භාර දෙනු ලැබූ මධ්‍යස්ථානයේ තබා ගැනීම සඳහා පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා වෙත බලය පවරමින් නියමයක් කරනු ලැබිය යුතු ය. ඒ කාල පරිච්ඡේදය ඒ භාරවන්නා අවස්ථාවෝචිත පරිදි, නිලධරයා හෝ තැනැත්තා විසින් පුනරුත්ථාපන කොමසාරිස් -ජනරාල්වරයාට භාර දුන් දිනයේ සිට ගණනය කරනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් -ජනරාල්වරයා විසින්, එම භාරවන්නා ඔහු වෙත භාර දෙනු ලැබූ දිනයේ සිට මාස දෙකක කාලයක් ඇතුළත දී, ඒ භාරවන්නා සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ පුනරුත්ථාපන කටයුත්තේ ස්වභාවය දක්වමින් රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

7. මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබූ භාරවන්නාට, මධ්‍යස්ථානය භාරව සිටින නිලධරයාගේ අවසරය ඇතිව, සෑම සති දෙකකට එක් වරක් තම දෙමව්පියන් හෝ ඥාතීන් හෝ භාරකරු හමුවීමට හිමිකම තිබිය යුතු ය.

8 (1) පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ඔහුගේ මතය අනුව ඉහත කී මාස දොළහක කාලසීමාව අවසන්වීමට පෙර භාරවන්නකු මුදා හැරීමේ හෝ ඔහු වැඩිපුර කාලපරිච්ඡේදයක් පුනරුත්ථාපනය කිරීමේ යෝග්‍යතාව පිළිබඳව රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(2) මාස දොළහක කාල පරිච්ඡේදය අවසානයේ දී (1) වන ජේදය යටතේ පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පරීක්ෂා කර බැලීමෙන් පසුව, රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් -

(අ) ඒ තැනැත්තා මුදාහැරීමට නියම කරනු ලැබිය හැකි ය, නැතහොත්,

(ආ) පුනරුත්ථාපන කාල පරිච්ඡේදය, වරකට මාස තුනක කාල පරිච්ඡේදයක් සඳහා දීර්ඝ කළ හැකි ය. කෙසේ වුව ද, ඒ දීර්ඝ කිරීම්වල මුළු කාල පරිච්ඡේදය මාස දොළහ නොඉක්මවිය යුතු ය. ඒ එක් එක් දීර්ඝ කිරීම පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයාගේ නිර්දේශය මත කරනු ලැබිය යුතු ය.

(3) දීර්ඝ කරන ලද පුනරුත්ථාපන කාල පරිච්ඡේදය අවසානයේ දී භාරවන්නා මුදාහරිනු ලැබිය යුතු ය.

9. (1) 5 වැනි නියෝගයේ (2) වැනි ජේදයේ විධිවිධාන ප්‍රකාර, ඒ තැනැත්තා භාර වූයේ යම් ස්ථානයක දී ද, ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය භාර පොලිස් අධිකාරිවරයා විසින්, ඒ තැනැත්තා මධ්‍යස්ථානය වෙත භාර දෙනු ලැබූ දින සිට මාස තුනක් ඉකුත් වූ පසු 3 වන නියෝගයේ (2) වැනි ජේදයේ දක්වා ඇති වරදක් සිදු කිරීමට සම්බන්ධ වී හෝ ප්‍රවේදිතාවක් දක්වා ඇතැයි සැක කරනු ලබන

එසේ භාර වූ තැනැත්තා ඒ වරද සම්බන්ධයෙන් කවර සම්බන්ධතාවයක් දැරුවේ ද යන්න, ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, විමර්ශනය කළ හැකිය.

(2) එසේ භාර වූ තැනැත්තාට විරුද්ධව නගා ඇති චෝදනාව හෝ අධි චෝදනාව නඩු විභාගයේ දී ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු විෂයෙහි පනවනු ලැබිය යුතු දණ්ඩන නියමය තීරණය කිරීමේ දී ඔහු එසේ භාරවීම ගැන අධිකරණය විසින් සැලකිල්ල දැක්විය හැකි ය. සුදුසු යයි අධිකරණය අදහස් කරන්නේ නම් , අධිකරණය විසින් තීරණය කරනු ලබන වැඩිදුරටත් වූ කාල පරිච්ඡේදයකට එම චූදිතයා මධ්‍යස්ථානයක රඳවා පුනරුත්ථාපනය කළ යුතු යයි අධිකරණය විසින් ආඥාකළ හැකි ය.

(3) වරදට වරදකරු බවට පත් වී 8 වන නියෝගයේ (2) වැනි ඡේදය ප්‍රකාරව අධිකරණයේ ආඥාවක් මත වැඩිදුර කාල පරිච්ඡේදයකට පුනරුත්ථාපනය කරනු ලැබීමට යටත්ව සිටින භාරවන්නකු ඔහුගේ පුනරුත්ථාපන වැඩසටහනට අහිතකර ආකාරයට හෝ මධ්‍යස්ථනයේ සිටින අනෙකුත් භාර වූ තැනැත්තන්ගේ අභිවෘද්ධියට අහිතකර ආකාරයට ක්‍රියා කළහොත්, ඔහුට විරුද්ධව දණ්ඩන නියම කළ අධිකරණය වෙත පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබූ විට, එකී තවදුරටත් වූ පුනරුත්ථාපනය කිරීම වෙනුවට අධිකරණය විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන ලඝු පරීක්ෂණයකින් පසු ඒ තැනැත්තා බන්ධනාගාර ගත කරනු ලැබීමට ආඥා කරනු ලැබිය හැකි ය.

10. (1) පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා විසින්, යම් දිස්ත්‍රික්කයක දිස්ත්‍රික් ලේකම්වරයා අදාළ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා සහ ජාතික ළමාරක්ෂක අධිකාරියේ සභාපතිවරයා විමසා,

(අ) (මෙහි මින්මතු " ළමා භාරවන්නා" යනුවෙන් හඳුන්වනු ලබන) මෙම නියෝගයේ (3) වන ඡේදය ප්‍රකාරව භාරවන්නා වූ හෝ සිරභාරයට ගනු ලබන වයස අවුරුදු 18 ට අඩු යම් තැනැත්තෙකු සඳහා නේවාසික පහසුකම් සැපයීමේ කාර්යය සඳහා ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවීමට සුදුසු ස්ථාන හඳුනාගැනීම සඳහා පියවර ගත යුතු ය.

(ආ) මේ නියෝග අදාළ වන යම් ළමයකු, ඔහුගේ පවුලට, ප්‍රජාවට සහ සමාජය තුළට යළි ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස සත්කාරය, මනෝ සාමාජික සහාය සහ වෘත්තිය සහ වෙනත් පුහුණුව ලබාදීමේ කාර්යය සඳහා ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවීමට සුදුසු ස්ථාන හඳුනාගැනීම සඳහා පියවර ගත යුතු ය.

(2) (1) වන ඡේදයේ සලස්වා ඇති පරිදි ස්ථාන හඳුනාගැනීම සහ හඳුනාගත් පසු, කොමසාරිස් -ජනරාල් විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, පිහිටුවනු ලබන මධ්‍යස්ථාන වර්ගය ද, එකී මධ්‍යස්ථානය පිහිටුවනු ලබන ස්ථානය ද නිශ්චිතව සඳහන් කළ යුතු වේ.

(3) (අ) ණය බැඳුම්කරයකට යටත් කරනු ලැබුවාවූ, බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් වැඩ ගැනීමට හෝ වහල්කමට යටත් කරනු ලැබුවා වූ නැතහොත් සන්නද්ධ අරගලයක දී එදිරිව ක්‍රියාකිරීම සඳහා බලයෙන් යොදා ගනු ලැබූ, හෝ බඳවා ගනු ලැබූ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 360ඇ වගන්තිය යටතේ වන වරදකට භාජනය කරනු ලැබුවා වූ ;

(ආ) ණය බැඳුම්කරයකට, බලහත්කාර හෝ අනිවාර්ය වැඩ ගැනීමට හෝ වහල් කමට යටත් කරනු ලැබුවා වූ නැතහොත් සන්නද්ධ අරගලයක දී එදිරිව ක්‍රියාකිරීමට බලෙන් බඳවා ගනු ලැබුවාවූ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 360ඇ වගන්තිය යටතේ වරදකට යටත් කරනු ලැබුවා වූ කාල සීමාව තුල දී යම් වරදක් සිදුකර ඇත්තා වූ හෝ සිදුකරන ලද බවට සැක කරනු ලැබූවා වූ ;

(ඇ) ඉහත කී සන්නද්ධ ගැටුමෙහි යම් පාර්ශවකරුවකුගේ තර්ජන හෝ පලිගැනීම් පිළිබඳව බිය හෝ යම් ණය බැඳුම්කරයකට හෝ බලහත්කාර හෝ අනිවාර්යෙන් වැඩ ගැනීමට හෝ වහල්කමට යටත් කරනු ලැබීම නැතහොත් සන්නද්ධ අරගලයක දී එරෙහිව ක්‍රියාකිරීම පිණිස බලෙන් බඳවා ගැනීම හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 360ඇ වගන්තිය යටතේ වූ යම් වරදකට භාජනය කරනු ඇතැයි යන බිය හේතුවෙන්,

මේ නියෝග අදාළ වන වයස අවුරුදු දහඅටට අඩු යම් ළමයකු, යම් පොලිස් නිලධරයකු හෝ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයකු වෙත භාරවන විට හෝ එබඳු තැනැත්තකු විසින් සිරභාරයට ගනු ලැබූ විට හෝ ජනාධිපතිවරයා විසින් නියෝගයක් මගින් බලය පවරනු ලැබූ යම් රාජ්‍ය නිලධරයකු, වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත භාරවන විට, එම පොලිස් නිලධරයා හෝ සන්නද්ධ හමුදාවල සාමාජිකයා හෝ ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ රාජ්‍ය නිලධරයා හෝ වෙනත් තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින්, මේ නියෝග අදාළ වන යම් ළමයකුගේ ප්‍රකාශය වාර්තා ගත කළ යුතු අතර, එවැනි ළමයකු භාරවූ හෝ සිරභාරයට ගනු ලැබූ, අවස්ථාගත කරුණු පිළිබඳව ද වාර්තා ගතකළ යුතු ය.

11 . එවැනි ප්‍රකාශයක් වාර්තාගත කරනු ලැබූ වහාම, ඒ ළමා භාරවන්නා භාර වූ හෝ සිරභාරයට ගනු ලැබූ, පොලිස් ස්ථානය හෝ සන්නද්ධ හමුදා ඒකකය භාර නිලධරයා විසින් හෝ ඔහු ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ යම් රාජ්‍ය නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත භාර වී ඇත්නම්, එම රාජ්‍ය නිලධරයා අයත් දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ, ආයතනයේ හෝ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ විසින් එසේ භාරවූ යම් ළමයෙකු -

(අ) වැඩිහිටි භාරවන්නන් හෝ වැඩිහිටි ඥාතීන් සිටී නම් ඔවුන්ගෙන් වෙන් වූ ස්ථානයක රඳවා තබාගැනීමටද; සහ

(ආ) ළමා භාරවන්නා ස්ත්‍රී පක්ෂයේ කෙනෙකු වූ විට -

(i) ළමා හෝ වැඩිහිටි පුරුෂ පක්ෂයේ ඥාතීන් හෝ භාරවන්නන් සිටී නම්, ඔවුන්ගෙන් වෙන් වූ ස්ථානයක; සහ

(ii) ඇය භාර වූ පොලිස් ස්ථානය හෝ සන්නද්ධ හමුදා ඒකකය භාර නිලධරයා විසින් පිළිවෙලින්, එම කාර්යය පවරනු ලැබූ පොලිසියේ කාන්තා නිලධරයෙකුගේ හෝ සන්නද්ධ හමුදාවන්හි කාන්තා සාමාජිකයෙකුගේ භාරයෙහි, සහ රැකවරණයෙහි සහ භාරකාරත්වයේ ද, නැතහොත් ඇය ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ යම් රාජ්‍ය නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත භාර වී ඇති විට, ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලබූ එම රාජ්‍ය නිලධරයා හෝ වෙනත් තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය අයත් වන දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ, ආයතනයේ හෝ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු විසින්, එම කාර්යය පවරනු ලැබූ එම දෙපාර්තමේන්තුවේ, කාර්යාලයේ ආයතනයේ හෝ සංවිධානයේ කාන්තා නිලධරයෙකුගේ භාරයෙහි, රැකවරණයෙහි සහ භාරකාරත්වයෙහි ද රඳවා තබා ගැනීමට,

වග බලා ගත යුතු ය.

12. (1) යම් ළමා භාර වන්නෙකු, සන්නද්ධ හමුදාවන්හි යම් සාමාජිකයෙකු හෝ ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ යම් රාජ්‍ය නිලධරයකු හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ වෙත භාරවී ඇති විට හෝ අත්අඩංගුවට ගෙන ඇති විට, සන්නද්ධ හමුදාවන්හි එම සාමාජිකයා හෝ රාජ්‍ය නිලධරයා හෝ එම තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින්, එම ළමයා වහාම සහ එසේ භාර වීමෙන් පසු පැය විසි හතරක් ඇතුළත ආකෘති පත්‍ර අංක 1 හි සාරානුකූලව දක්වනු ලැබූ වාර්තාවක් ද සමග ළඟම ඇති පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය. ආකෘති පත්‍ර අංක 1 හි සාරානුකූලව කරන ලද වාර්තාවේ මුල් පිටපත පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයා වෙත භාරදිය යුතු අතර එහි දෙවැනි පිටපත එම වාර්තාව කරනු ලබන තැනැත්තා ළඟ තබා ගත යුතු ය. එසේ ඉදිරිපත් කරනු ලබන වේලාවේ දී එකී ළමයාගේ ප්‍රකාශයේ වාර්තාව ද එකී ළමයා භාර වනු ලැබුයේ යම් අවස්ථානුගත කරුණු මත ද එම කරුණු පිළිබඳ වාර්තාව ද පොලිසියට දෙනු ලැබිය යුතු ය.

(2) එම ළමා භාර වන්නා පිළිබඳව මේ නියෝගවල උපලේඛනයේ ආකෘති පත්‍ර අංක 02 හි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ වාර්තාවක් පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

13 (1) යම් ළමා භාරවන්නකු පොලිසීයට භාර වී ඇත්තාවූ හෝ පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත්තාවූ අවස්ථාවක හෝ සන්නද්ධ හමුදාවක කිසියම් සාමාජිකයෙකු විසින් හෝ ජනාධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ යම් රාජ්‍ය නිලධරයකු යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් පොලිස් ස්ථානයකට ඉදිරිපත් කරනු ලැබූ හෝ අවස්ථාවක දී එම පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එම ළමයා එසේ භාරවීම පිළිබඳව එම ළමයාගේ දෙමාපියන්ට හෝ භාරකරුවාට ද, පරිවාස නිලධරයාට සහ ජාතික ළමාරක්ෂක අධිකාරියේ එකී ප්‍රදේශය වෙනුවෙන් කටයුතු කරන, සම්බන්ධීකරණ නිලධාරියාට ද, දැනුම් දීමට වහාම සියලුම පියවර ගත යුතු අතර, එබඳු භාරවීමක් සිදු වී පැය විසිහතරක කාලයක් තුළ අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත එම ළමයා ඉදිරිපත් කළ යුතු ය.

(2) එම ළමා භාර වන්නා ඉදිරිපත් කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ද, එකී මහෙස්ත්‍රාත්වරයා විසින් ඃ -

(අ) අවශ්‍ය වන්නේ නම් පොලිසිය, ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන කිරීමේ නිලධාරියා හෝ ජාතික ළමාරක්ෂක අධිකාරියේ සම්බන්ධීකරණ නිලධරයා සහ හැකි අවස්ථාවල දී එම ළමයාගේ දෙමාපියන්ගේ ද, සහාය ඇතිව, එකී පරිවාස නිලධරයා විමසා, එකී ළමයා අප්‍රසිද්ධියේ, අධිකරණයේ දී හෝ එකී මහෙස්ත්‍රාත්වරයාගේ නිල නිවසේ දී සම්මුඛ පරීක්ෂණයකට භාජනය කළ යුතු ය.

එසේ වුව ද, එකී සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සඳහා එම ළමයාගේ මව්භාෂාව භාවිතා කිරීමට හෝ එසේ කළ නොහැකි අවස්ථාවන්හි දී එකිනෙහි ම එකී සම්මුඛ පරීක්ෂණයේ පරිවර්තනයක් ලබාදීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට මහෙස්ත්‍රාත්වරයා වග බලා ගත යුතු ය.

(ආ) එම ළමයා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීමට නියෝග කළ යුතු ය.

(ඇ) එකී ළමයා තමා වෙත ඉදිරිපත් කරන ලද දින සිට මාසයක කාලයක් ඇතුළත එම ළමයාගේ ආසන්නතම අවශ්‍යතා හා දීර්ඝ කාලීන අවශ්‍යතා පැහැදිළිව සඳහන් කරමින් සමාජ විමර්ෂණ වාර්තාවක් ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ නිලධරයා සහ ජාතික ළමාරක්ෂක අධිකාරියේ අදාළ ප්‍රදේශය භාර සම්බන්ධීකරණ නිලධරයා ද විමසා සකස් කරන ලෙස එකී පරිවාස නිලධරයාට නියෝග කළ යුතු ය.

(ඈ) ළමා භාර වන්නා ඔහුගේ දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ භාරයට, රැකවරණයට සහ භාරකාරත්වයට ආපසු යැවීමට හෝ, පළාත්බද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ සහාය සහ නිරීක්ෂණය යටතේ එම ළමයාට ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක මාසයක කාල පරිච්ඡේදයක් සඳහා නවාතැන් ලබාදිය යුතු බවට සහ එම ළමයා නැවැත්වීමට නියමිත ස්ථානයේ ලිපිනය පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයාට වහාම දැනුම් දිය යුතු බවට ද නියෝග කළ යුතුය ඃ

එසේ වුව ද, ළමා භාරවන්නකු සටන්කාමියෙකු ලෙස සන්නද්ධ ගැටුමක නියැළී ඇති බවට සාක්ෂි ඇති අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ඇගයීමේ කාර්යය සඳහා අවුරුදු එකක කාලයක් සඳහා ඔහු ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබිය යුතු ය.

14. (1) මේ නියෝග අදාළ වන යම් ළමයකුට ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක නවාතැන් සපයා දෙනු ලැබ ඇති අවස්ථාවකදී, මහේස්ත්‍රාත්වරයා විසින්, 13 වන නියෝගයේ (2) වන ඡේදයේ (ඈ) අනු ඡේදයේ සඳහන් එක් මාසයක කාල පරිච්ඡේදය අවසානයේ දී එවැනි පරීක්ෂණයේ සහ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල සහ 13 වන නියෝගයේ (2) වන ඡේදයේ (ඇ) අනු ඡේදයේ සඳහන් සමාජ විමර්ශන වාර්තාව සැලකිල්ලකට ගනිමින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිගමනයකට එළඹිය යුතුය ඃ-

(අ) එම ළමා භාරවන්නා ඔහුගේ දෙමව්පියන්ගේ හෝ භාරකරුවන්ගේ භාරයට, රැකවරණයට සහ භාරකාරත්වයට ආපසු භාරදිය යුතු ද යන්න;

(ආ) එවැනි ළමා භාරවන්නකුට, පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ රැකවරණය සහ අධීක්ෂණය යටතේ ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයේ දී එක් වර්ෂයක් නොඉක්මවන්නා වූ කාල පරිච්ඡේදයක් සඳහා නවාතැන් සපයා දිය යුතු ද යන්න; හෝ,

(ඇ) එම ළමයා වර්ෂයක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක රඳවා තැබිය යුතු ද යන්න පිළිබඳව මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කළ යුතු ය :

එසේ වුව ද, ළමා භාරවන්නකු සටන්කාමියෙකු ලෙස බඳවා ගනු ලැබ සිටි කාලසීමාව තුළ යම් අවස්ථාවක, එම ළමා භාරවන්නා වරදක් සිදු කරන ලද බවට සාක්ෂි තිබේ නම්, මහේස්ත්‍රාත්වරයා විසින් අවුරුදු එකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා එම ළමයා ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක රඳවා තැබිය යුතු ය :

එසේම තවදුරටත්, එම ළමා භාරවන්නා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් ඉහත දක්වා ඇති ඔහුගේ සමාලෝචනය කිරීමේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, එම ළමයා රඳවා තබා ඇත්තේ යම් ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක ද, එම මධ්‍යස්ථානය භාරව සිටින තැනැත්තා විසින් එම ළමයා සම්බන්ධයෙන් කාර්තු වාර්තා තමා වෙත භාරදීමට නියම කළ හැකි ය.

(2) (අ) (1) වන ඡේදයේ දක්වා ඇති නිගමනයට එළඹීමේදී මහේස්ත්‍රාත්වරයා විසින්, —

(i) යම් ළමා භාරවන්නෙකුගේ ආරක්ෂාව සහ වැඩීම යහපත සිදුවන බවට වගබලා ගැනීමේ අවශ්‍යතාව ; සහ

(ii) යම් ළමා භාරවන්නෙකුගේ සහ ඔහුගේ පවුලේ ආරක්ෂාව සෑම කල්හි සහතික කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් පවුල එක්සත් කිරීමේ සහ විස්තෘත පවුල තුළට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය,

සැලකිල්ලට ගත යුතු ය.

(ආ) තම නිගමනයට එළඹීමේදී, අවස්ථාවෝචිත පරිදි, ආරක්ෂක ළමා නේවාසික මධ්‍යස්ථානයේ හෝ ආරක්ෂක ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ එම ළමයා නවත්වනු ලබන කාලසීමාව පිළිබඳ තම නිර්දේශ ද සහිතව එසේ භාර වූ ළමයා නේවාසිකව තබන හෝ පදිංචිව සිටින ස්ථානයේ ලිපිනය ද සමග තම නිගමනයේ පිටපතක් පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයාට වහාම සන්නිවේදනය කිරීමට මහේස්ත්‍රාත්වරයා විසින් සලස්වනු ලැබිය යුතු ය.

15. මේ නියෝගයේ විධිවිධාන යටතේ යම් ළමා භාරවන්නෙකු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ද, එකී මහෙස්ත්‍රාත්වරයා හෝ 13 වන නියෝගයේ (2) වන ඡේදයේ විධිවිධාන යටතේ නිගමනයකට එළඹෙන මහෙස්ත්‍රාත්වරයා හෝ විසින් -

(අ) 13 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ සිදුකරනු ලබන වෛද්‍ය පරීක්ෂණයේ දී සහ සම්මුඛ පරීක්ෂණයේ දී ; සහ

(ආ) එම ළමයා යවනු ලැබිය හැකි ආරක්ෂක ළමා නේවාසික මධ්‍යස්ථානයේ දී සහ ආරක්ෂක ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේදී,

ළමා හිතකාමී කාර්යපටිපාටි භාවිත කළ යුතු බවට විධාන කළ යුතු අතර, ළමා භාරවන්නාට ආචාරශීලිව, සැලකිල්ලෙන් යුතුව සහ කරුණාවෙන් සලකනු ලබන බවට වගබලාගත යුතු ය.

16. (1) එවැනි ළමා භාරවන්නකු ඔහුගේ දෙමාපියන් හෝ භාරකරු වෙත ආපසු යැවීමට මහෙස්ත්‍රාත්වරයා නියෝග කරන්නේ නම්, ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරි හෝ ජාතික ළමා ආරක්ෂන අධිකාරියේ සම්බන්ධීකාරකගේ ද, සහයෝගය ඇතිව පරිවාස නිලධාරි විසින් එවැනි ළමයකු ඔහුගේ පවුලට සහ සමාජයට ඒකාබද්ධවීම සහ ඉන් අනතුරුව ඔහු දෙමාපියන් හෝ භාරකරු වෙත ආපසු යවන ලද දිනයේ සිට අවුරුද්දක කාලපරිච්ඡේදයක් තුළ ඔහුගේ ප්‍රගතිය අධීක්ෂණය කළ යුතු බවට ද ඔහු විසින් නියෝග කළ යුතු ය. එවැනි ළමයකු මාසිකව හමු වී ඔහුගේ ප්‍රගතිය පිළිබඳව මාසික වාර්තා අධිකරණයට සහ පළාත් බද පරිවාස සහ ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීම, අවස්ථාවෝචිත පරිදි, එම පරිවාස නිලධාරියාගේ, ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධරයාගේ හෝ ජාතික ළමා අයිතිවාසිකම් අධිකාරියේ සම්බන්ධීකාරකගේ කාර්යය වන්නේ ය.

(2) දිස්ත්‍රික්කයේ පවතින ප්‍රතිඒකාබද්ධ කිරීම පිළිබඳ සේවාවන්ගෙන් එම ළමයාට ප්‍රතිලාභ ලැබෙන බවට වගබලා ගැනීම සඳහා පළාත්බද පරිවාස සහ ළමා ආරක්ෂක සේවා කොමසාරිස් සියලු පියවර ගත යුතු ය. එවැනි ප්‍රතිඒකාබද්ධ කිරීමේ සේවාවන්, දිස්ත්‍රික්කයේ, පවත්නා වෙනත් ළමා ආරක්ෂන නියෝජ්‍යායතනවල සහයෝගය ඇතිව දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුවේ සභාපතිවරයා විසින් සම්බන්ධීකරණය කළ යුතු ය.

තවද, පළාත්බද පරිවාස සහ ළමා ආරක්ෂක සේවා කොමසාරිස් විසින් එම ළමයා සම්බන්ධයෙන් මේ නියෝගවල උපලේඛනයේ ආකෘති පත්‍ර අංක 3 හි සාරානුකූල වූ නිශ්චිතව දක්වා ඇති වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.

(3) පළාත් බද පරිවාස සහ ළමා ආරක්ෂක සේවා ප්‍රාදේශීය කොමසාරිස් විසින් එවැනි ළමයකුගේ ප්‍රගතිය පිළිබඳ ත්‍රෛමාසික වාර්තා පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා වෙත යොමු කළ යුතු ය.

17. යම් ළමා භාරවන්නකු, යම් ළමා ආරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක නතර කළ යුතු බවට මහෙස්ත්‍රාත්වරයා නියෝග කරන්නේ නම්, එම ළමා ආරක්ෂක නේවාසික මධ්‍යස්ථානය එම මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ බලසීමාවට ඇතුළත් අධිකරණ කොට්ඨාසයක් නොවන අධිකරණ කොට්ඨාසයක පිහිටා ඇති අවස්ථාවක, එම මහෙස්ත්‍රාත්වරයා විසින් එම ළමා ආරක්ෂක නේවාසික මධ්‍යස්ථානය පිහිටා ඇති ප්‍රදේශ සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත අධිකරණ වාර්තාව යොමුකළ යුතු ය.

18. (1) යම් ළමා භාරවන්නෙකුට නේවාසික පහසුකම් සලස්වා ඇති ආරක්ෂක ළමා නේවාසික මධ්‍යස්ථානක් භාරව සිටින නිලධාරියා විසින් -

(අ) ළමා භාරවන්නා වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂා කරනු ලැබීමට සලස්වා, ඔහුට අවශ්‍ය සෞඛ්‍ය සත්කාරය සැපයීමට අවශ්‍ය පියවර ගැනීමට සැලැස්විය යුතු ය,

(ආ) 16 වන නියෝගයේ නියමිත පරිදි, සමාජ විමර්ෂන වාර්තාවේ හඳුනාගත් ඒ ළමයාගේ අවශ්‍යතාවයන්ට අනුකූලව ඔහුට මනෝසාමාජික උපදේශනය ලබා දිය යුතු ය,

(ඇ) යටත් පිරිසෙයින් සෑම සති දෙකකටම එක් වරක්වත් පවුලේ සාමාජිකයන්ට ඔහු හමුවීමට සහ ඔහු හා සම්බන්ධතා පැවැත්වීමට පහසුකම් සැලැස්වීමට සහ දිරිගැන්වීම කළ යුතු ය,

(ඈ) ළමයාට අවශ්‍ය ශාරීරික ආරක්ෂාව සහ පෝෂණය ලබා දිය යුතු ය.

(ඉ) ලබා ගැනීමට ළමයාට නීතිමය හිමිකමක් ඇති නමුත් දැනට ඔහු සතුව නොමැති හඳුනා ගැනීමේ සහ වෙනත් ලේඛන, ලබා ගැනීමට සහාය දිය යුතු ය,

(ඊ) එම ළමයාගේ කැමැත්ත පරිදි වෘත්තියක් කරගෙන යාමට ඔහු සන්නද්ධ කිරීමේ අරමුණින් ඔහුට අධ්‍යාපනය හෝ සුදුසු වෘත්තීය, තාක්ෂණික හා වෙනත් පුහුණුව ලබා දිය යුතු ය,

(උ) එම ළමා භාරවන්නන්ගේ වර්තමාන තත්ත්වයේ සිදුවන යම් වෙනස්කම්, ඔහුට සපයනු ලබන පුහුණුවීම් සහ පහසුකම් සහ එම ළමයාගේ ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ඇතුළත් මාසික වාර්තා සකස් කිරීම එම වාර්තා මහෙස්ත්‍රාත්වරයා, පරිවාස නිලධාරියා සහ පුනරුත්ථාපන කොමසාරිස් -ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම කළ යුතු ය,

(ඌ) පළාත් බද පරිවාස හා ළමාරක්ෂණ සේවා කොමසාරිස් විසින් මේ නියෝගවල ආකෘතිපත්‍ර අංක 3 ට සාරානුකූලව වූ වාර්තාවක් එම එක් ළමා භාරවන්නා සම්බන්ධයෙන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.

(2) ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිපත්‍ර අංක 4 ට සාරානුකූලව වූ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.

19. 18 වන නියෝගයේ දක්වා ඇති වාර්තා භාර දෙනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයෙකුට ද, එම මහෙස්ත්‍රාත්වරයා, මේ නියෝග අදාළ වන යම් ළමා භාරවන්නෙකුගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාමාර්ග ගත යුතු අතර, එම ළමා භාරවන්නාට, ළමා ආරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක නේවාසිකව පහසුකම් සලස්වාදීම හෝ ඔහුගේ දෙමාපියන්ගේ හෝ භාරකරුගේ භාරය, රැකවරණය සහ පාලනය යටතට නැවත පැමිණවීම එම ළමයා සම්බන්ධයෙන් වඩා යෝග්‍ය විය හැකි ය, යනු ඔහුගේ මතය වන්නේ නම්, එම ළමයා එබඳු ළමා ආරක්ෂක පුනරුත්ථාප මධ්‍යස්ථානයකට පැවරීම හෝ ඔහුගේ දෙමාපියන්ගේ භාරය, රැකවරණය සහ පාලනය යටතට යළි පැමිණවීම සිදු කළ යුතු ය.

20. එවැනි ළමා භාරවන්නකු ළමා ආරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක නේවාසික ඉඩ කඩ සපයා දිය යුතු බවට හෝ එවැනි ළමයකු ඔහුගේ දෙමාපියන්ගේ භාරය, රැකවරණය සහ පාලනයට නැවත පැමිණවිය යුතු බවට මහෙස්ත්‍රාත්වරයා නියෝග කරන අවස්ථාවල දී-

(අ) එම ළමා භාරවන්නා මාරුකර හරිනු ලැබ ඇති යවනු ලැබ ඇති හෝ ස්ථානයේ ලිපිනය පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයාට දැනුම් දීමට ; සහ

(ආ) ඔහුගේ නියෝගයේ සහතික කළ පිටපතක්, අවස්ථාවෝචිත පරිදි, දෙමාපියන් වෙත හෝ භාරකරු වෙත සහ එමෙන්ම පොලීසියට ද නිකුත් කිරීමටත්,

ඔහු විසින් කටයුතු සැලැස්විය යුතු ය.

21. මේ නියෝගය අදාළ වන එවැනි යම් ළමයකු ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් තුළ රඳවා තැබිය යුතු බවට සහ එකී ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානය එකී මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ බලයට යටත් නොවන්නා වූ වෙනත් අධිකරණ බලසීමාවක් තුළ පිහිටියේ නම්,

(අ) එකී මහෙස්ත්‍රාත්වරයා විසින්, එකී ළමා භාරවන්නාට අදාළ වාර්තා එම ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාට මාරුකර යැවිය යුතු ය; සහ

(ආ) එකී ළමා භාරවන්නාගේ ප්‍රගතිය නියාමනය කිරීම භාරකරනු ලැබූ පරිවාස නිලධාරියා විසින් එකී ළමා භාරවන්නාට අදාළ සියලු සටහන් සහ වාර්තා එකී ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය සම්බන්ධයෙන් බලය ඇති අදාළ පරිවාස නිලධරයාහට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

22 (1) එම ළමා භාරවන්නා රඳවා තබා ඇත්තේ යම් ළමා ආරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක ද, එම ළමා ආරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානය භාර නිලධාරියා විසින් :-

(අ) එම ළමා භාරවන්නා වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂා කරනු ලැබීමට සලස්වා, ඔහුට අවශ්‍ය සෞඛ්‍ය සත්කාරය සැපයීමට අවශ්‍ය පියවර ගැනීමට සැලැස්විය යුතු ය;

(ආ) එවැනි ළමයකු සම්බන්ධයෙන්, 18 වන නියෝගය යටතේ නියමිත සමාජ විමර්ශන වාර්තාවේ හඳුනාගත් ඒ ළමයාගේ අවශ්‍යතාවන්ට අනුකූලව ඔහුට මනෝසාමාජික උපදේශන ලබාදිය යුතු ය;

(ඇ) යටත් පිරිසෙයින් මසකට එක් වරක් වත් පවුලේ සාමාජිකයන්ට ඔහු හමුවීමට සහ ඔහු හා සම්බන්ධතා පැවැත්වීමට පහසුකම් සැලැස්වීම සහ දිරිගැන්වීම කළ යුතු ය;

(ඈ) එම ළමා භාරවන්නාට අවශ්‍ය පෝෂණය සහ ශාරීරික ආරක්ෂාව ලබා දිය යුතු ය;

(ඉ) එවැනි ළමයකුට ලබාගැනීමට නියමිත හිමිකමක් ඇති, එනමුත් දැනට ඔහු සතුව නොමැති හඳුනා ගැනීමේ සහ වෙනත් ලේඛන, ලබා ගැනීමට සහාය දිය යුතු ය;

(ඊ) එම ළමයාට ඔහුගේ කැමැත්ත පරිදි වෘත්තියක් කරගෙන යාමට කටයුතු සම්පාදනය කිරීම සඳහා ඔහුට අධ්‍යාපනය හෝ සුදුසු වෘත්තීය, තාක්ෂණික හා වෙනත් පුහුණුව ලබා දිය යුතු ය;

(ඌ) එම ළමයාගේ වර්තමාන තත්ත්වයේ සිදුවන යම් වෙනස්කම්, ඔහුට සපයනු ලබන පුහුණුවීම් සහ පහසුකම්, එම ළමයාගේ ප්‍රගතිය සම්බන්ධව තොරතුරු ඇතුළත් ත්‍රෛමාසික වාර්තා සකස් කිරීමටත්, එම වාර්තා මහේස්ත්‍රාත්වරයා, පරිවාස නිලධාරියා සහ පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ඍ) පළාත්බද පරිවාස හා ළමාරක්ෂණ සේවා කොමසාරිස්වරයා විසින්, එක් එක් ළමයා සම්බන්ධයෙන් මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍ර අංක 3 ට සාරානුකූලව වූ වාර්තාවක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.

(2) ළමා ආරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානය භාර නිලධරයා විසින් මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍ර අංක 4 ට සාරානුකූලව වූ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය.

23. (1) 18 වන නියෝගයේ දක්වා ඇති වාර්තා යොමු කරනු ලැබූ මහෙස්ත්‍රාත්වරයා විසින්, -

(අ) එවැනි ළමා භාරවන්නකු, අවස්ථාවෝචිත පරිදි, ළමා ආරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක හෝ යම් ආරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක නේවාසික තැබීමට හෝ රඳවා තැබීමට කරන ලද ඔහුගේ තීරණය, ළමා භාරවන්නාගේ ප්‍රගතිය සහ ආරක්ෂාව මනාව නිරීක්ෂණය කෙරෙන බවට වග බලා ගැනීම පිණිස ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් නම් මසකට වරක් ද ළමා ආරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් නම් මාස තුනකට වරක් ද සමාලෝචනය කළ යුතු ය; සහ

(ආ) එවැනි ළමා භාරවන්නකු වෙනත් යම් දිස්ත්‍රික්කයක වූ වෙනත් මධ්‍යස්ථානයක නේවාසිකව රැඳවීම හෝ ඔහුගේ දෙමාපියන්ගේ හෝ භාරකරුගේ භාරය, රැකවරණය සහ පාලනයට නැවත පැමිණවීම වඩාත් යෝග්‍ය බව ඔහුගේ මතය වන අවස්ථාවක, එවැනි ළමා භාරවන්නකු එවැනි වෙනත් යම් දිස්ත්‍රික්කයක වූ වෙනත් මධ්‍යස්ථානයකට හෝ ඔහුගේ දෙමාපියන්ගේ හෝ භාරකරුගේ භාරය, රැකවරණය සහ පාලනය යටතට පැවරිය යුතු ය.

(2) පළාත්බද ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක් භාර නිලධරයා විසින් මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිපත්‍ර අංක 4 ට සාරානුකූලව වූ වාර්තාවක් පවත්වාගත යුතු ය.

(24) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල -

"ණය බැඳුම්කරය" යන්නට "බලහත්කාර හෝ අනිවාර්ය වැඩ ගැනීම" සහ "වහල්කම" යන්නට (19 වන අධිකාරය වන) දණ්ඩ නීති සංග්‍රහයේ ඒවාට දී ඇති අර්ථයම ඇත්තේ ය,

"පරිවාස නිලධරයා" යන්නෙන් "ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධරයා" සහ "ජාතික ළමාරක්ෂක අධිකාරියේ සම්බන්ධීකාරක" යන්නෙන් පිළිවෙලින් මේ නියෝග අදාළ වන යම් ළමා භාරවන්නකු හෝ ඔහු නවත්වා ඇති හෝ තබා ඇති ළමා ආරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක් හෝ ළමාරක්ෂක පරිවාස මධ්‍යස්ථානයක් පිහිටා ඇති ප්‍රදේශයන් සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති පරිවාස නිලධරයා, ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධරයා, සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සම්බන්ධීකාරක අදහස් වේ.

"පොලිස් ස්ථානය භාර නිලධරයා" යන්නෙන් භාරවීම සිදු වූ ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකාරී බලය ඇති පොලිස් ස්ථානයෙහි ස්ථානභාර නිලධරයා අදහස් වේ.

"මහෙස්ත්‍රාත්වරයා" යන්නෙන් යම් ළමා භාරවන්නා හෝ මේ නියෝගවල සලසා ඇති පරිදි ළමා භාරවන්නා නේවාසිකව සිටින ආරක්ෂිත ළමා නේවාසිකාගාරය හෝ එම ළමයා රඳවා සිටින ආරක්ෂක ළමා පුනරුත්ථාපන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා අදහස් වේ."

උපලේඛනය

අනුක්‍රමික අංකය

*ආකෘතිපත්‍ර අංක 1*

(12 (1) නියෝගය)

මේ නියෝග අදාළ වන යම් ළමයකු භාරවන්නේ යම් තැනැත්තෙකු වෙත ද, ඒ තැනැත්තා හෝ ඒ ළමයා අත්අඩංගුවට ගනු ලබන්නේ කවරෙක් විසින් ද, ඒ තැනැත්තා විසින් හෝ එක් එක් ළමයා සම්බන්ධයෙන් පිරවිය යුතු ආකෘති පත්‍රය (පිටපත් දෙකකින් යුතුව පිරවිය යුතු ය)

| | |
|---|---|
| 1. නම | |
| 2. වයස | |
| 3. ස්ත්‍රී/පුරුෂ භාවය | |
| 4. ලිපිනය | |
| 5. භාරවූ /අත්අඩංගුවට ගත් ස්ථානය, දිනය සහ වේලාව | |
| 6. ළමයාගේ අවස්ථාපිත කරුණු | |
| 7. පොලිසියට භාරදුන් ස්ථානය, දිනය සහ වේලාව | |
| 8. ළමයා භාරදෙන නිලධාරියාගේ නම සහ අත්සන | |
| 9. ළමයා භාරගත් පොලිස් නිලධරයාගේ නම සහ අත්සන | |

*ආකෘතිපත්‍ර අංක 2*

(12 (2) නියෝගය)

*පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින්, එක් එක් ළමයා සම්බන්ධයෙන් ම භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*

| | |
|---|---|
| 1. නම | |
| 2. වයස | |
| 3. ස්ත්‍රී/පුරුෂ භාවය | |
| 4. ලිපිනය | |
| 5. භාරවූ හෝ/සිරභාරයට ගනු ලැබූ දිනය සහ වේලාව හා ස්ථානය | |
| 6. දෙමව්පියන් වෙත දැනුම් දුන් දිනය සහ වේලාව | |
| 7. පරිවාස නිලධරයා වෙත දැනුම් දුන් දිනය සහ වේලාව | |
| 8. ජාතික ළමාරක්ෂක අධිකාරියේ සම්බන්ධීකාරක වෙත දැනුම්දුන් වේලාව සහ දිනය | |
| 9. වැඩිහිටි රැඳවියන්ගෙන් වෙන්කොට තබන්නේ ද යන වග | |

| | |
|---|---|
| 10. කාන්තා පක්ෂයේ කෙනෙකු නම්, නිලධාරිනියක භාරයේ තබන්නේ ද යන වග සහ එම නිලධාරිනියගේ නම | |
| 11. රජයේ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කළ දිනය සහ වේලාව | |
| 12. මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ දිනය සහ වේලාව | |
| 13. ළමයා කැටුව යන පොලිස් නිලධරයාගේ නම | |
| 14. වෛද්‍ය පරීක්ෂණය සිදු කළ දිනය සහ වේලාව | |
| 15. මහෙස්ත්‍රාත්වරයාගේ අතුරු නියෝගය | |
| 16. පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා වෙත දැනුම් දෙන ලද දිනය සහ වේලාව | |

***ආකෘති පත්‍ර අංක 3***

(නියෝග 16 (2) , 22 (1) (ඌ 18 (1) (ඌ))

*එක් එක් ළමයා සම්බන්ධයෙන් පළාත්බද පරිවාස සහ ළමා රක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් භාවිතා කළ යුතු ආකෘති පත්‍රය*

| | |
|---|---|
| 1. නම | |
| 2. වයස | |
| 3. ස්ත්‍රී/පුරුෂ භාවය | |
| 4. ලිපිනය | |
| 5. පොලිසියෙන් දැනුම් දෙන ලද දිනය සහ වේලාව | |
| 6. භාර කරන ලද පරිවාස නිලධරයාගේ නම | |
| 7. අතුරු ඇගයීමක් ක්‍රියාත්මක කරන ලද්දේ ද යන බව සහ අධිකරණය වෙත වාර්තා කරන ලද්දේ කවදා ද යන බව | |
| 8. මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද අතුරු නියෝගය දිනය සහ රඳවා තබන ලද ස්ථානය | |
| 9. පූර්ණ සමාජ විමර්ෂණයක් පවත්වන ලද්දේ ද යන බව සහ අධිකරණය වෙත වාර්තා කරන ලද්දේ කවදා ද යන බව | |
| 10. මහෙස්ත්‍රාත්වරයා විසින් කරන ලද යළි ඒකාබද්ධ කිරීමේ නියෝගය දිනය සහ රඳවා තබන ලද ස්ථානය | |
| 11. ස්ථානගත කිරීමේ වාර්තා ලැබුණේ පරිවාස නිලධරයාගෙන් හෝ නේවාසික මධ්‍යස්ථානයේ කාර්යභාර නිලධරයාගෙන් හෝ පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ කාර්යභාර නිලධරයාගෙන් ද යන වග සහ එය මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලද්දේ ද යන බව :- 1 වන මාසය | |
| 12. 2 වන මාසය | |
| 13. 3 වන මාසය - 1 වන කාර්තුව | |
| 14. 4 වන මාසය | |
| 15. 5 වන මාසය | |

| | |
|---|---|
| 16. 6 වන මසය - 2 වැනි කාර්තුව | |
| 17. 7 වන මාසය | |
| 18. 8 වන මාසය | |
| 19. 9 වන මාසය - 3 වන කාර්තුව | |
| 20. 10 වන මාසය | |
| 21. 11 වන මාසය | |
| 22. 12 වන මාසය - 4 වන කාර්තුව | |

***ආකෘති පත්‍ර අංක 4***

(23 (2) නියෝගය)

*ළමා ආරක්ෂක නේවාසික මධ්‍යස්ථානය භාර නිලධාරියා විසින් පිරවිය යුතු ආකෘති පත්‍රය*

| | |
|---|---|
| 1. නම | |
| 2. වයස | |
| 3. ලිපිනය | |
| 4. සෞඛ්‍ය ආරක්ෂණය (අත්අඩංගුවට ගත් විට සපයන ලද්දේ ද යන්න)<br>(1)<br>(2)<br>(3)<br>(4)<br>(5)<br>(6)<br>(7)<br>(8)<br>(9)<br>(10)<br>(11)<br>(12) | |
| 5. මනෝවිද්‍යාත්මක උපදේශනය (මාසික වාර්තා)<br>(1)<br>(2)<br>(3)<br>(4)<br>(5)<br>(6)<br>(7)<br>(8)<br>(9)<br>(10)<br>(11)<br>(12) | |

| | |
|---|---|
| 6. පවුලේ සාමාජිකයන් බැහැදැකීම (පැමිණි දින සහ කරුණු) | |
| 7. හඳුනාගැනීමේ සහ අනෙකුත් ලියකියවිලි (සපයා ඇද්ද යන බව) | |
| 8. අධ්‍යාපන (මාසික වාර්තාව)<br>(1)<br>(2)<br>(3)<br>(4)<br>(5)<br>(6)<br>(7)<br>(8)<br>(9)<br>(10)<br>(11)<br>(12) | |
| 9.වෘත්තීය පුහුණුව (මාසික වාර්තා)<br>(1)<br>(2)<br>(3)<br>(4)<br>(5)<br>(6)<br>(7)<br>(8)<br>(9)<br>(10)<br>(11)<br>(12) | |
| 10.වෙනත් පුහුණුවීම් (මාසික වාර්තා)<br>(1)<br>(2)<br>(3)<br>(4)<br>(5)<br>(6)<br>(7)<br>(8)<br>(9)<br>(10)<br>(11)<br>(12) | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.